# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම
## (Recovery Plan for Learning Lost - 2022)

## භූගෝල විද්‍යාව - පළමුවන වාරය

## 6 - ශ්‍රේණිය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Lost - 2022) - 6 ශ්‍රේණිය

(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 09ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **6 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| 6.1 | 6.1.1 තම පාසල හා අවට වටපිටාව පිළිබඳ තොරතුරු රැස්කර ඉදිරිපත් කරයි. | • පාසල පිහිටි පරිපාලන කොට්ඨාස ධුරාවලි නම් කරයි.<br>• ශ්‍රී ලංකා ආකෘති සිතියමක පාසලේ පිහිටීම ලකුණු කරයි.<br>• පාසල පිහිටි භූමියේ සැලැස්ම ඇඳ ඉඩමේ හැඩය ඉදිරිපත් කරයි.<br>• තෝරාගත් වැදගත් ස්ථාන කිහිපයකට පාසලේ සිට ඇති දිශාව හා දුර දක්වන වගුවක් සකස් කරයි. | **පාසල හා අවට වටපිටාව**<br>• පාසලක පිහිටීම හඳුනා ගැනීම.<br>• දිශාව හඳුනාගැනීම. (පාසල අවට තෝරා ගත් ස්ථාන වල දිශාව හඳුනා ගැනීම) | 6.1 | 1. පාසල හා අවට වටපිටාව | 09 |
| | 6.1.2 පාසල අවට වටපිටාවේ කාලගුණික ස්වභාවය විස්තර කරයි. | • කාලගුණය යන්න අර්ථ දක්වයි.<br>• කාලගුණික අංග නම් කරයි.<br>• උෂ්ණත්වමානයක් භාවිත කර උෂ්ණත්වය සටහන් කරයි.<br>• වර්ෂාමානයක් භාවිත කර වර්ෂාපතනය මැන සටහන් කරයි.<br>• සුළං දිශා දර්ශකයක් භාවිතයෙන් සුළං හමන දිශාව ප්‍රකාශ කරයි.<br>• අහස නිරීක්ෂණය කර වලා වැස්ම පළිබඳ සටහන් තබා ගනී.<br>• සුවිශේෂ කාලගුණික සංසිද්ධීන් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.<br>• පාසල අවට වටපිටාවේ දෛනික කාලගුණය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කරයි. | • පාසල හා අවට කාලගුණය (ප්‍රදේශයේ කාලගුණය පිළිබඳ නිරීක්ෂණය කර රැස් කර ගත් තොරතුරු මත ක්‍රියාකාරකම් ගොණුවක් සකස් කරන්න.) | | | |